අංක 2
1976 ඔක්තෝබර් - දෙසැම්බර්
මිල රු. 1.50 යි

'මාවත' ප්‍රකාශනයෝ
අශෝක පොත්හල නිවසේ
183, ගාලු පාර
කොළඹ 1.

# මාවත

ප්‍රගතිශීලී කලා, සාහිත්‍ය හා සංස්කෘතික ප්‍රකාශනය

## මෙවර කලාපයේ

සංස්කෘතික අරගලය ඉදිරියට ගෙන යමු -1
— සංස්කාරකවරු

කඩුව සහ පොත -9
— ඩී. බී. කුරුප්පු

1956 න් පසු ජයග්‍රාහී සාහිත්‍ය අරගලය -13
— සියල් සෝමරත්න

කවි -19
— මාඩ සේතුං, දොනගම සිරිවර්ධන, කිත්සිරි නිමල්යාපා

ඉබි ගමන -20
— එස්. ජී. පුංචිහේවා

පාඨක සංවාදය -21

සවන් දෙන්න ජනතාවගේ භාෂාවට -24
— පරාක්‍රම කොඩිතුවක්කු

මනමේ විසි අවුරුදු ජයන්තිය -30
— මාවත සටහනක්

රේබාව - සිංහල සිනමාවේ මං සලකුණක් -31
— මාවත සටහනක්

මෙහි පළවන ලිපි, ඒ බව සඳහන් කරමින්, සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් යළි පළ කිරීමට විශේෂ අවසරයක් අවශ්‍ය නැත.

## සටහන

# සංස්කෘතික අරගලය ඉදිරියට ගෙන යමු



මාවත මුල් කලාපයෙන් අප ලැබූ අත්දැකීම අද සංස්කෘතික අරගලයේ ස්වභාවය ගැන කාරණා කීපයක් හෙළි කරයි. අරගලය ඇස් පනා පිට උත්සන්න වෙනවා. එහි බලාපොරොත්තු නැවුම්, ඉතාමත්ම පොහොසත්. එය පැහැදිලිවම බහුජනතාවගේ ඕනෑ එපාකම් නියෝජනය කරයි. එය තිරව බහුජනතාව සඳහාය. එය ජාතික බහුජන ව්‍යාපාරයේ සංස්කෘතික මුහුණුවරයි. පසුගිය සහරාවෙන් ''අපේ සංස්කෘතික ප්‍රශ්නය'' සම්පාදනය වුනා. කළ යුත්තේ කුමක්ද? යන්නයි ඊළඟට මතුවෙන්නේ. අපේ පාඨක හිතවතුන් ඊට නිසැක පිළිතුරු සැපයුවා – සංස්කෘතික අරගලය එකහෙලාම ඉදිරියට ගෙන යන්න! අපි එය හොඳින් ඒත්තු ගන්නා. මේ කතුවැකිය හා කලාපය එහි ප්‍රතිපලයයි.

මංගල කලාපයේ අඩුපාඩු කීපයක් ගැන හිතවතුන් අපට කරුණු පෙන්නා දුන්නා. ''අපේ සංස්කෘතික ප්‍රශ්නය'' සම්පාදනය කිරීමේදී, දෙමළ හා මුස්ලිම් ජන කොටස් නියෝජනය වෙලා තිබුණේ නැහැ. ඊට අපි ඔවුන්ගෙන් සමාව ඉල්ලනවා. කතුවැකියේ භාෂා විලාසය ගැන සාධාරණ විවේචන ලැබුණා. සහරාවේ ලිපි හරබර විය යුතු අතර, ලිපිවල සරලබව හා සංකීර්ණත්වය විවිධ මට්ටම්වලින් තිබීම හොඳ බව අපට වැටහුනා. **මේ විවේචන අපේ වටිනාම දායාදයන්. මිතුරන්ගේ විවේචන – නිර්දය විවේචන – අපට අපේ වැරදි නිවැරදි කරගන්නට මග පෙන්වනවා.** බහුජනතාව නියෝජනය කරන අපේ පාඨකයින්ගෙන් ඉගෙන ගන්නට අපි හැමවිටම සූදානම්.

(3 වැනි පිටුවට)

# පනස් හයෙන් පසු සාහිත්‍ය අරගලය

—සියල් සෝමරත්න

සංස්කාරකවරු: ජේ. විජේසූරිය, සිසිල් දහනායකවර්ධන, සුනිල් සිරිවර්ධන, සියල් සෝමරත්න, කුමුදු කුසුම් කුමාර

## සංස්කෘතික අරගලය ඉදිරියට.....

අරගලය ඉදිරියට ගෙන යන්නට නම්, අරගලය වැටී ඇති මහ එලිපෙහෙලි කරගන්න ඕනැමයි. ඒත් අරගල මහට වැටීමට කලින් පැහැදිලි කර ගත යුතු වැදගත් මූලික කරුණු දෙකක් තියෙනවා. **දේශපාලනය හා සංස්කෘතිය** එකක්: අනික **ඉතිහාස** අවදියයි.

### දේශපාලනය හා සංස්කෘතිය

**සමාජ ඉතිහාසයේ ප්‍රධාන අරගලය දේශපාලන අරගලයයි. සංස්කෘතික අරගලය එම දේශපාලන අරගලයට සේවය කරන, ඊට කිට්ටුවෙන් වෙලී පවතින දෙවෙනි මට්ටමේ අරගලයක්.**

දේශපාලන අරගලය තුළ හැමවිටම ප්‍රගතිශීලී – ප්‍රතිගාමී වශයෙන් ක්‍රියාදාමයන් දෙකක් පවතිනවා. ඒ වගේම දේශපාලන අරගලය තුළ ජාතික හා පරගැති වශයෙන්ද ස්වරූප දෙකක් තියෙනවා. **ඒ නිසා රටක ප්‍රධාන අරගලය විය යුත්තේ එහි ජාතික, ප්‍රගතිශීලී දේශපාලන අරගලයයි.** එය ප්‍රධාන අරගලය ලෙස සලකන්නේ බහුජනතාවට සේවයක් සිදුවෙන්නේ ඉන් පමණක් වන නිසයි. පරගැති ප්‍රතිගාමී දේශපාලන ක්‍රියාදාමය අවශ්‍යයෙන්ම වැඩිදෙනාට එරෙහිව, ටික දෙනෙකු සඳහා පවතින එකක්. මේ ප්‍රධාන අරගලයට සම්බන්ධ අරගලයක් සංස්කෘතික ක්ෂේත්‍රයේද සිදුවෙනවා. එය සිදුවෙන්නේ ජාතික ප්‍රගතිශීලී සංස්කෘතික ව්‍යාපාරය හා පරගැති ප්‍රතිගාමී සංස්කෘතික ව්‍යාපාරය අතරයි.

මේ ක්ෂේත්‍ර දෙකේ අරගල ක්‍රියාදාමයන්, රටක ඉතිහාසයේ ඕනෑම යුගයක හා අවදියක පවතිනවා. ඒත් යුගයෙන් යුගයට, අවදියෙන් අවදියට ජාතික ප්‍රගතිශීලී මෙන්ම පරගැති ප්‍රතිගාමී ක්‍රියාදාමයන්වල ස්වරූප වෙනස්.

දේශපාලනයයි සංස්කෘතියයි අතර හිතවත් බැඳුමක් අවශ්‍යමයි. පීඩිත බහුජනතාවගේ ජීවත්වීමේ අයිතීන් පිළිබඳ ප්‍රශ්න සේරම විසඳන්න පුළුවන් වන්නේ දේශපාලන විසඳුමකින් පමණයි. ඒ නිසා රටක දේශපාලන ව්‍යාපාරය එහි ජන ජීවිතයේ මුල් තැන ගන්නවා. සංස්කෘතියත් ජන ජීවිතයට නැතුවම බැරි සාධකයක්. ඒත් රටක සංස්කෘතිය තීන්දු කරන මූලික සාධකය ආර්ථිකය හා දේශපාලනය නිසා, සංස්කෘතිය දේශපාලනයට දෙවෙනි වෙනවා. **ඒ නිසා නිවැරදි සංස්කෘතික දැක්මකට උපත දෙන උල්පත, නිවැරදි දේශපාලනයයි.**

දේශපාලනයත්, සංස්කෘතියත් එකිනෙකට සම්බන්ධ ක්ෂේත්‍ර දෙකක් වුනත්, ඒවා එකක්ම නොවේ. එක් එක් ක්ෂේත්‍රයට ඊට ආවේනික ක්‍රියාකිරීමේ රීති තියෙනවා. මේවාට අපි නියාමයන් කියල කියනවා. **යම්කිසි ක්ෂේත්‍රයකට අදළ නියාමයන් පිහිටා ඇත්තේ, එය ඇතුළතයි. ඒ නිසා කිසියම් විෂයක හෝ ක්ෂේත්‍රයක ඇතුළත නියාමයන් යනුවෙන් ඒවා හැඳින්විය යුතුයි. දේශපාලනයේ ඇතුළත නියාමයන් සංස්කෘතියේ ඇතුළත නියාමයන්ට වඩා වෙනස් වෙයි. මේ වෙනස ඇති වෙන්නේ එකිනෙකට වෙනස් සාධකවලින් එම ක්ෂේත්‍රවල අභ්‍යන්තරය ගොඩනැගෙන නිසයි.** පන්ති අරගලයෙන් තීරණය කෙරෙන බලය හා බලය පාවිච්චි කිරීම මුල් කර ගෙන දේශපාලනයේ ඇතුළත නියාමයන් ගොඩනැගෙයි; සිතුවිලි හා හැඟුම් දනවෙන මතවාදී ක්‍රියාකාරීත්වය හා ඊට ගැලපෙන භෞතික නිර්මාණ විලාස මුල් කර ගෙන සංස්කෘතියේ ඇතුළත නියාමයන් ගොඩනැගෙයි.

**වැඩවසම් යුගයේ සූරාකෑවුණු හා සූරාකෑ පන්ති හිටිය අතර, සූරාකෑවුණු ගැමි අතිබහුතරය දුක්බර ජීවිතයක් ගත කළා. ඒත් යටත්විජිතවාදී හා නවයටත්විජිතවාදී පීඩාව හා ආධිපත්‍යය, ඕනෑම වෙනත් දේශීය වැඩවසම් පීඩනයකට වඩා පිළිකුල් සහගතය. පොදු ජනතාවගේ වටිනාම වස්තුව ඔවුන්ගේ දේශපාලන, ආර්ථික, සංස්කෘතික හා සමාජමය නිදහසයි. මේ නිසා රටක ඉතිහාසය නිර්මාණය කිරීමේ උතුම් කාරිය, මූලික වශයෙන්, එහි ජනතාවගේම වරප්‍රසාදයක්. යටත්විජිතවාදය හා නවයටත්විජිතවාදය රටක ජනතාව සතු ඒ උතුම් වරප්‍රසාදය ඔවුන්ගෙන් සොරා ගනියි.**

---

දේශපාලනයේ හා සංස්කෘතියේ හිතකර ගැලපීම වශයෙන් අප සලකන්නේ, ක්ෂේත්‍ර දෙකේ ඇතුළත නියාමයන් හොඳාකාරව අවබෝධ කර ගෙන, දෙක අතර පැවැත්වෙන අන්‍යෝන්‍ය සේවයටයි.

එක අරගලයක යෙදී සිටින්නෙක්, එකවර හා දැනුවත්ව, අනික් අරගලයෙහිද යෙදී සිටියි. මෙහිදී අනගාරික ධර්මපාල තුමා, වත්තුහාමි කව්කොල රචකයා, පියදස සිරිසේන, මහින්ද හාමුදුරුවෝ, උඩකැන්දවල සිරි සරණංකර හාමුදුරුවෝ, කුමාරතුංග මුනිදස, හේමපාල මුනිදස, සාගර පළන්සූරිය, අල්විස් පෙරේරා අපට ඉබේටම සිහියට එනවා.

සංස්කෘතික අරගල මහට පිවිසෙන එක දොරටුවක් දේශපාලනය හා සංස්කෘතිය අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධය නම්, එහි අනික් දොරටුව අප ජීවත්වන ඉතිහාස අවදියයි.

### ඉතිහාස අවදිය

දකුණු හා අග්නිදිග ආසියාවේ සහෝදර ජාතීන්ට වගේම, අගය කරන්නට පුළුවන් උසස් ජාතික ඉතිහාසයක් හා සංස්කෘතියක්, අපටද තිබුණු බව අපේ දිග වැඩවසම් ඉතිහාසය ඔප්පු කරයි. **වැඩවසම් යුගයේ සූරාකෑවුණු හා සූරාකෑ පන්ති හිටිය අතර, සූරාකෑවුණු ගැමි අතිබහුතරය දුක්බර ජීවිතයක් ගත කළා. ඒත් යටත්විජිතවාදී හා නවයටත්විජිතවාදී පීඩාව හා ආධිපත්‍යය, ඕනෑම වෙනත් දේශීය වැඩවසම් පීඩනයකට වඩා පිළිකුල් සහගතය. පොදු ජනතාවගේ වටිනාම වස්තුව ඔවුන්ගේ දේශපාලන, ආර්ථික, සංස්කෘතික හා සමාජමය නිදහසයි. මේ නිසා රටක ඉතිහාසය නිර්මාණය කිරීමේ උතුම් කාරිය, මූලික වශයෙන්, එහි ජනතාවගේම වරප්‍රසාදයක්. යටත්විජිතවාදය හා නවයටත්විජිතවාදය රටක ජනතාව සතු ඒ උතුම් වරප්‍රසාදය ඔවුන්ගෙන් සොරා ගනියි.**

ඉතිහාසයේ වර්තමාන අවදිය තේරුම් ගැනීම සඳහා මේ අවදියේ ආර්ථික ස්වරූපය සොයා බැලීම අත්‍යාවශ්‍යයි. වතුකරයේ හැර, ගම්බදව අපේ නිෂ්පාදන බලවේග දියුණු වෙලා තියෙන්නේ සුළු භාණ්ඩ නිෂ්පාදනය හරය කොට ගෙනයි. ගමේ හුවමාරු වෙන මුදල්, මේ සුළු භාණ්ඩ නිෂ්පාදනයෙන් වැස්සෙන මුදල්ය. අද ගොවිතැන හැමතැනම වාගේ පැතිරී පවතියි. එහිදී බිම්කුලිය මුදල්මය ස්වරූපයක් ගන්නා මට්ටමට තවමත් වර්ධනය වෙලා නැති අතර, එය ගන්නේ ද්‍රව්‍යමය ස්වරූපයක්ය. ගමේ පවතින නිෂ්පාදන සම්බන්ධතාවල නිශ්චිත වැඩවසම් අඩංගුවක් අදත් පවතියි. ගම හා සන්සන්දනය කරන කොට, වතුකරය ඊට වැඩි ප්‍රමාණයක ධනේශ්වර නිෂ්පාදන ක්‍රමයක ලක්ෂණ හරය කොට ගෙන තියෙනවා.

# සංස්කෘතික අරගලය ඉදිරියට.....

අනෙක් අතට නගරබදව ප්‍රධාන වශයෙන් ඇත්තේ වෙළඳ ධනවාදයක්. වෙළඳ ධනවාදය ගන්නේ කාර්මික හෝ නිෂ්පාදන ධනවාදයට වඩා වෙනස් ස්වරූපයක්. වෙළඳ ධනවාදයේ ක්‍රියාකරි පුරුක් වශයෙන් කටයුතු කරන්නේ, නිෂ්පාදකයා හා පාරිභෝගිකයා අතර වැජඹෙන විවිධ මාදිලියේ අතරමැදින්ය. බොහෝ අවස්ථාවල නිෂ්පාදකයා ජීවත් වෙන්නේ ගමකය; පාරිභෝගිකයා ඉන්නේ එක්කෝ නගරයේය, නැත්නම්පිට රටකය.

පසුගිය අවුරුදු දහයක පමණ කාලය තුළදී ආර්ථික ක්ෂේත්‍රයේ නව නැඹුරුවීම් දෙකක් දකින්නට පුළුවන. ඉන් එකක් නම් කාර්මික, නිෂ්පාදන ධනපති පංතියක බීජ වැපිරි තිබීමයි. අනික නම් ආර්ථික කටයුතුවලට රජයේ මැදිහත්වීම වැඩිදියුණු වීමයි. රාජ්‍ය ධනවාදය පහළ වුනේ අපේ ධනවාදයේ පැවැති දුබල, නොදියුණු තත්වය නිසාමයි. රාජ්‍ය ධනවාදය කාර්මික හා වෙළඳ ක්ෂේත්‍ර දක්වා පළල් වෙමින් පවතිනවා.

ලංකාවේ ධනවාදය, වැඩවසම්වාදයේ ප්‍රතිවිරෝධතා මෝරායාමෙන්, ස්වාභාවිකව ඉපදුන එකක් නොවෙයි: එය යටත් විජිතවාදයේ මහිමයෙන් අවජාතකව පහළවුන එකක්. මෙසේ වැඩවසම්වාදය මත ධනවාදය බලෙන් පැටවීමෙන්, අපේ සමාජයේ අලුතෙන් පන්ති කීපයක් බිහිවුනා. මේ පන්ති බිහිවීමේදී වැඩවසම්වාදය හා ධනවාදය අතර ගැටීම් හා මුසුවීම් නොකඩවා සිදුවුනා. ප්‍රධාන වශයෙන් බිහිවුන අලුත් පන්ති තුන නම් කම්කරු පන්තිය, සුළු ධනපති පන්තිය හා ධනපති පංතියයි. මේ පංතිවල හැඩය තීරණය කරන නිශ්චිත සාධක තියෙනවා. ඒවා නම් ඔවුන්ට අයිති ආර්ථික බලය, අධිරාජ්‍යවාදය හා නවයටත්විජිතවාදය සමඟ ඔවුන්ගේ සම්බන්ධය, සමාජ හා අධ්‍යාපන පසුබිම, හා සංස්කෘතික හැඩගැස්මයි. අපේ ධනපතීන් ප්‍රධාන වශයෙන් පෝෂණය වුනේ ඉඩම් හිමිකමෙන්, වෙළහෙලඳමෙන් හා පරිපාලන සේවය, නීතිඥ වෘත්තිය, වෛද්‍ය වෘත්තිය වැනි ප්‍රභූ වෘත්තීන් මගිනි. අපේ සුළු ධනපතීන් වර්ධනය වුනේ සුළු ඉඩම් හිමිකම, සුළු භාණ්ඩ වෙළඳම, අධ්‍යාපනය, ප්‍රභූ වෘත්තීන් හා විවිධ මට්ටම්වල රජයේ සේවයෙනි. මේ පංති, එකවර, නොකඩවා වැඩෙමින් හා පිරිහෙමින් පවතින නිසා, ඔවුන් තුළ නිතරම එකිනෙකට ප්‍රතිවිරුද්ධ ආකල්ප හා විකල්ප කැටිව පවතිනවා.

ආර්ථික හා දේශපාලන වශයෙන් වගේම, සංස්කෘතික වශයෙන්ද ධනපති පංතික කොටස් පැහැදිලි දෙපිලකට බෙදෙනවා. ඔවුන්ගෙන් එක කොටසක් අධිරාජ්‍යවාදයට හා නව යටත්විජිතවාදයට ගැතියි: අනෙක් කොටස පැහැදිලිවම දේශප්‍රේමීයි. සංස්කෘතික කෝදුවක් පාවිච්චි කරමින් මාර්ටින් වික්‍රමසිංහ බමුණු කුලය වශයෙන් 1956 දී හැඳින්වූයේ, මේ පරගැති තට්ටුවයි.

එක නිශ්චිත ක්ෂේත්‍රයක වැඩවසම්වාදී බලපෑම ප්‍රබලයි. ඒ ගම්බද ගොවි ජනතාවගේ සිතුවිලි පද්ධතිය තුළය. ඊට අඩු ප්‍රමාණයකින් ඒ ලක්ෂණය නගරබදවද පවතීයි. කුල චාරිත්‍ර, මිත්‍යා විශ්වාස, නක්ෂත්‍රය වැනි වැඩවසම් අවදියේ සිතුම් පැතුම්වල බලපෑම තවමත් සැලකිය යුතු තරම්ය. ගමේ වැඩිහිටි කොටස් අතර මේ නැඹුරුව වැඩියි. මේ තත්වයට එරෙහිව මානවවාදය, සමානාත්මතාවාදය හා ප්‍රජාතන්ත්‍රවාදය සඳහා දෘෂ්ටිමය අරගලයක් අද ගම්බදව කෙරෙනවා. එහි නියමුවන් හැටියට ඉන්නේ ප්‍රජාතන්ත්‍රවාදී හා ප්‍රගතිශීලි වැඩිහිටි මෙන්ම උගත් තරුණ ගැමි ජනතාවයි.

නවයටත්විජිතවාදී සංස්කෘතික ආක්‍රමණය අපට දැඩිව පීඩා කරනවා. බහුජනතාවගේ ඓතිහාසික හා සංස්කෘතික යථාර්තයට මූලිකත්වය දෙන්නේ නැති සෑම දහමක් හා ක්‍රියාවක්ම, මේ හතුරු සංස්කෘතියට සේවය කරයි. මෙහි ප්‍රධාන නියෝජිතයින් නවයටත්විජිතවාදයට ගැති ධනේශ්වරයින්ය. එහි ප්‍රධාන ගොදුර විසිරී පවතින සෑම තරාතිරමකම සුළු ධනේශ්වරයින්ය. එහි ප්‍රධාන තිප්පොල කොළඹය. කොළඹ හරහා එය වේගයෙන් ගම් තුළට විහිදෙයි. දැනුම හා තාක්ෂණය හැඩගස්වන අධ්‍යාපනික ක්ෂේත්‍රවල ඉතා සැඟවුනු ආකාරයකටත්, ගුවන් විදුලිය, පුවත්පත් සඟරා, සිනමාව, ප්‍රචාරක දැන්වීම් වැනි දෘෂ්‍යමය හා ශ්‍රව්‍යමය ජනසංනිවේදන මාධ්‍යවල ඊට වඩා ප්‍රකට ආකාරයකටත්. මේ වහල් සංස්කෘතිය අපව ආක්‍රමණය කරනවා. කායික ශ්‍රමයෙන් සම්පූර්ණයෙන්ම වෙන් කළ අධ්‍යාපන උරුමය, බහුතරයකට කියවීමේ හැකියාව තිබීම, ජනගහනයෙන් වැඩිකොටස තරුණ තරුණියන් වීම හා අපේ ඉතිහාසයෙන්ම උරුම වන කරුණාව මෛත්‍රිය වැනි සාධක, නවයටත්විජිතවාදී දහම් පතුරුවා හැරීමට වාසි වෙන විදිහකට යොදා ගැනීමට හතුරන් සමත්වෙලා තියෙනවා.

අපේ සෑම නිෂ්පාදන හා සංවර්ධන කටයුත්තකටම අධිරාජ්‍යවාදය හා නවයටත්විජිතවාදය මැදිහත් වෙනවා. ඇත්ත වශයෙන්ම අපි ආර්ථික වශයෙන් දෙපය පොලොවේ ගහ ගන්නට අරගල කරන්නේ, නවයටත්විජිතවාදයේ ගොදුරක් වශයෙන් ඉන්නා අතරමයි. අපේ විදේශ ණයගැතිභාවය, හිඟ ගෙවුම් හා වෙළෙඳ ශේෂ, නිෂ්පාදන බලවේගවල සීමිත දියුණුව වැනි කරුණු මේ අවනතභාවය පළ කරන අවස්ථා කීපයකි. ඊනියා හරිත විප්ලවය මගින් අපේ ගොවිතැනද කෙලින්ම නවයටත්විජිතවාදයට ගැට ගැහිලාය. එහෙම වුනත්, මේ අවනතභාවයට විරුද්ධව දැඩි අරගලයක්ද කෙරෙනවා. තුන්වෙනි ලෝකයේ අනික් රටවල් සමග අප ගෙනියන නවයටත්විජිත විරෝධී අරගලය, පැසසිය යුතු වගේම ආස්වාදජනකය.

මේ කෙටි කරුණු දැක්වීම අනුව අද අප ජීවත්වෙන්නේ අර්ධ–වැඩවසම්, අර්ධ–ධනේශ්වර නිෂ්පාදන ක්‍රමයක් ඇති සමාජයකය. ධනේශ්වර ක්‍රියාදමය මේ නිෂ්පාදන ක්‍රමයේ අධිපති තත්වය දරනවා. ඒ වගේම අර්ධ-වැඩවසම්, අර්ධ–ධනේශ්වර ක්‍රියාදමයන් වර්ධනය වෙන්නේ, අධිරාජ්‍යවාදයේ හා නවයටත්විජිතවාදී ස්වරූපයේ බලපෑමට කොටු වී, හැම අතින්ම ඉන් පීඩා විඳින තත්වයක් තුළ ඉඳගෙන, ඉන් මිදීමට අරගල කරමින්ය.

මේ ඉතිහාස අවදියේ පවතින දේශපාලන ක්‍රියාදමයේ වැදගත්ම හා වටිනාම සාධකය වෙන්නේ. පීඩා විඳින සෑම පංතියකින්ම සමන්විත බහුජනතාවගේ අරගල කිරීමේ හැකියාව හා අයෝමය දේශප්‍රේමී විමුක්තිකාමී බලාපොරොත්තුය. කම්කරු පංතියේ නායකත්වයෙන් දුප්පත් ගොවීන් ඇතුළු අනික් සියලු ප්‍රගතිශීලි සමාජ පංතීන්ගේ සහයෝගය ලබාගෙන, නව ප්‍රජාතන්ත්‍රවාදී අරගලය නැත්නම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී අරගලය ඉදිරියට ගෙනයා යුතුව තිබෙන්නේ ඒ නිසාය. දුප්පත් ගොවීන්ගේ හා කම්කරුවන්ගේ මිත්‍රත්වය අද බලවත්ම සමාජ අවශ්‍යතාවයකි. සිංහල, දෙමළ, මුස්ලිම් ඇතුළු අනික් සෑම ජන කොටසකම පීඩා විඳින්නන්ගේ අන්‍යෝන්‍ය සහෝදරත්වය හා සමගියද, මේ අරගලයේ විශේෂ අවශ්‍යතාවයකි. ස්වාධීන කම්කරු පංතික නායකත්වයක් ඇති ප්‍රගතිශීලීන්ගේ සමගියකින් පමණි, නව ප්‍රජාතන්ත්‍රවාදී නැත්නම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී අරගලය සිදුවෙන්නේ. මේ අරගලයේදී නවයටත්විජිතවාදයට හා එහි ගැත්තනට එරෙහි වෙන ධනේශ්වර හා

අනෙක් සෑම ප්‍රගතිශීලි කොටසක්ම අපේ මිතුරන්ය. නවයටත්විජිතවාදය ක්‍රියාත්මක කරන අධිරාජ්‍යවාදීන් හා ඔවුන්ට ගැතිකම් කරන ධනේශ්වර හා වෙනත් කොටස් ස්ථිරවම අපේ හතුරන්ය.

ඉතිහාස අවදිය කෙටියෙන් සටහන් කළාට පසුව, අපි සංස්කෘතික අරගලයේ මහ පිළිබඳ ගැටළුවලට පැමිණෙනවා.

## අරගලය හා මතවාදය

මෙහිදී අරගලයේ මෑත ඉතිහාසය ආයෙත් මතක් කර ගැනීම ඵලදායකයි. 1956 සංස්කෘතික වශයෙන් විශේෂ ප්‍රමාණාත්මක වැදගත්කමක් දරයි. 1860 ගණන්වල සිට පිබිදෙමින් හා මෙළවෙමින් තිබුණ ජාතික ප්‍රගතිශීලි සංස්කෘතික අරගලයේ පැතුම් හා බලාපොරොත්තු එද උච්චස්ථානයකට පත්වුනා. මේ ජාතික සංස්කෘතික අරගලයේ ඓතිහාසික නියෝජිතයින් වුනු ගොවි–කම්කරු–සඟ–වෙද–ගුරු බලවේග එක පෙරමුණකට පැමිණීම මේ ජයග්‍රහණයට මුල්වුනා. 1956 බණ්ඩාරනායක අගමැතිතුමාගේ නායකත්වයෙන් පත්වුනු රජය සංස්කෘතික අරගලය පිළිබඳ පැහැදිලි නියෝජනත්වයක් දරුවා විතරක් නෙවෙයි, ඒ සම්බන්ධයෙන් එය නිශ්චිත ක්‍රියාවලියක්ද දියත් කළා.

1956 දී තවත් දෙයක් සිද්ධ වුනා. කොළඹ ගුරුකුලය නියෝජනය කළ ජාතික ප්‍රගතිශීලි බහුතර සාහිත්‍ය ව්‍යාපාරය යටපත් කරමින්, පේරාදෙණි ගුරුකුලය නියෝජනය කළ නවයටත්විජිතවාදී ප්‍රතිගාමී සුළුතර සාහිත්‍ය ව්‍යාපාරය නැගී සිටියේද 1956 සිට 1970 දක්වා වකවානුවේය. 1956 සිදුවුන සාහිත්‍යමය හා සංස්කෘතික බලවේගවල ඒකරාශිවීමේ ගුණාත්මක පළ ප්‍රයෝජන නොලැබුනේ මේ නිසයි. 1970 දී තත්වය ආයෙත් මාරුවුනා. ඉන්පසු බහුතර බලවේගය නව මට්ටමකින් හා නව ස්වරූපයකින් අරගලය නැවතත් පටන් ගත්තා. ඒ අරගලයට මැදි වෙලාය අද අප ඉන්නේ.

1956 න් පසුව සිදුවුන මේ පරස්පර විරෝධී ක්‍රියා පිළිවෙලට හේතු සෙවීමේදී අපට මුහුණ පාන්නට වෙන ප්‍රධානම ප්‍රශ්නය තමයි අරගලය හා මතවාදය අතර සම්බන්ධය.

සංස්කෘතික අරගලයේ හරය, දැක්ම නැත්නම් මතවාදයයි. සංස්කෘතියේ අමුද්‍රව්‍ය වගේම මෙවලම්ද මතවාදීයි. ඒ අමු ද්‍රව්‍ය හා මෙවලම් ප්‍රයෝජනයට ගෙන, සංස්කෘතියේ අධ්‍යාත්මික (ගීතයක්, නාට්‍යයක්, දහමක්) හෝ භෞතික (නගුලක්, දැබක්, දුන්නක්) යන දෙපක්ෂයෙන් එකකට අයිති වෙන නිර්මාණයක් බිහි කරන්න පුළුවන්. සමස්ත සංස්කෘතික පද්ධතිය ගොඩ නැගී ඇත්තේ දැක්ම මුල් කර ගෙනයි. ඒ නිසා මතවාදය, සංස්කෘතික ක්‍රියාදමයේ ඇතුළත න්‍යාමයක්. මතවාදය සංස්කෘතියෙන් වෙන් කරන්නට බැරි ඒ නිසයි.

---

**මේ ඉතිහාස අවදියේ පවතින දේශපාලන ක්‍රියාදමයේ වැදගත්ම හා වටිනාම සාධකය වෙන්නේ, පීඩා විඳින සෑම පංතියකින්ම සමන්විත බහුජනතාවගේ අරගල කිරීමේ හැකියාව හා අයෝමය දේශප්‍රේමී විමුක්තිකාමී බලාපොරොත්තුය. කම්කරු පංතියේ නායකත්වයෙන් දුප්පත් ගොවීන් ඇතුළු ප්‍රගතිශීලි සමාජ පංතීන්ගේ සහයෝගය ලබාගෙන, නව ප්‍රජාතන්ත්‍රවාදී අරගලය නැත්නම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී අරගලය ඉදිරියට ගෙනයා යුතුව තිබෙන්නේ ඒ නිසාය.**

---

මාවතේ දැක්ම නැත්නම් මතවාදය අපි මුල ඉඳන්ම එළි කළා. මෙහිදී අප එය තවත් නිශ්චිතව හා පැහැදිලිව පළ කරනවා.

සංස්කෘතික ක්‍රියාවන් කෙලින්ම හා වක්ව දැනුම නිර්මාණය කරනවා. ඒ නිසායි අපට අප අතර ඉන්නා කිසිම සංස්කෘතික සේවකයෙක් නොසලකා හරින්න බැරි. දැනුම නිර්මාණය කරන්නාට සමාජය කෙරෙහි නිශ්චිත වගකීම් පැවරෙනවා.

අපේ සෑම සංස්කෘතික සේවකයෙක්ම මුලින්ම තෝරා බේරා ගත යුතු ප්‍රශ්න දෙකක් තියෙනවා. පළමුවැන්න ලෝකයේ පවතින මතවාද දෙකෙන් ඔහු පිළිගන්නේ මොන මතවාදයද යන්නයි. දෙවැන්න තමා පිළිගන්නා මතවාදයෙන් ජනතාවට කොහොම සේවය කරනවාද යන්නයි.

අද අප අතර බලවත්ව ඇති මතවාදය නවයටත්විජිතවාදීයි. ඒ නිසාම එය ධනවාදීයි. නවයටත්විජිතවාදී මතවාදය කුමන දේශීය ස්වරූපයක් ගත්තත්, එහි හරය නවයටත්විජිතවාදීයි-ධනවාදීයි. පැත්තකින් නවයටත් විජිතවාදයෙනුත්, පැත්තකින් වැඩවසම් වාදයෙනුත්, මේ ධනේශ්වර මතවාදය පෝෂණය වෙනවා. **නවයටත්විජිතවාදයෙන් පීඩා විඳින සියලුම බහුජන කොටස්වලට සේවය කරන ප්‍රගතිශීලි සංස්කෘතික සේවකයා, මේ අධිපති මතවාදයට එරෙහිව විකල්ප මතවාදයක් ගොඩනගයි. ඒ විකල්ප මතවාදය හැබෑ ලෙසම අරගල මතවාදයක්. එය උපත ලබන්නේත්, පවතින්නේත්, වැඩෙන්නේත් අරගලයෙනි.**

අපේ සමාජ යථාර්තය සාරවත් ලෙස ප්‍රකාශ වෙන, ඒ යථාර්තය බහුජනතාව වෙනුවෙන් ප්‍රගතිය කරා වෙනස් කිරීමට තේජස් මහිම ඇති අපේම මතවාදයක් ගොඩනැගීම, අපි මුහුණ දිය යුතු අභියෝගයකි. එම අභියෝගය ආස්වාද ජනකය: එහි ජනතා ගුණය විරෝධාරය. එය උල්පත් දෙකකින් උකහා ගන්න ඕනෑ. එකක් ජන ජීවිතයයි: අනික ප්‍රගතිශීලි මතවාදයයි. මේ උල්පත් දෙකෙන්ම අවශ්‍ය පෝෂණය ලබන ප්‍රගතිශීලියා, මනෝරාජිකවීම, අධි-මනෝමූලිකවීම, අවස්ථාවාදිවීම, අතිවාමාංශිකවීම, රැඩිකල්වීම යනාදි වල්මත්වීම් වලින් වළකියි.

සංස්කෘතික සේවකයා මතවාදී ප්‍රශ්නය හමුවේ සෘජුව හා එඩිතරව ස්ථාවරයක් ගැනීම අත්‍යාවශ්‍යයි. තමා තුළත්, සාමූහිකව තමා වැඩ කරන ක්ෂේත්‍රයේත්, මේ ප්‍රශ්නය මතු කර, ඊට පැහැදිලි පිළිතුරු සොයාගෙන නැති පුද්ගලයා, බහුතරයට සේවය නොකරන පළායන්නෙක්, බොරුකාරයෙක්, අවස්ථාවාදියෙක්, නැත්නම් ආත්මාර්ථකාමියෙක් වීමට ඉඩ තියෙනවා.

## අරගලයේ අත්දැකීම්

1940 ගණන්වල සිට පටන් ගන්නා කොළඹ-පේරාදෙණි මතවාදී අරගලය, 1970 ට පසුව, වැඩුනු ආකාරය අනුව, එය පැහැදිලිවම ප්‍රගතිශීලි ගුරුකුලයට ජයක්. ''ජනතා සාහිත්‍යයක්'' හා ''ජනතා කලාවක්'' සඳහා නැගුන හඬ, එක් අරගල අවස්ථාවක නිමවීමත් තවත් අවස්ථාවක ඇරඹීමත් ප්‍රකාශ කරයි. මෙවර සාහිත්‍ය උත්සවයේ මාතෘකාව ''1956 න් පසු සාහිත්‍යය'' හැටියට තේරීම ගැන අපි සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා ඇතුළුව අදාළ සෑම කෙනෙකුටම සුබ පතනවා. නව සාහිත්‍ය හා සංස්කෘතික යුග බෙදීම බහුජනතාවගේ පැත්තට වාසි වෙන විදියට පැහැදිලි කර දුන් සෑම සංස්කෘතික සේවකයෙකුටම අපේ උණුසුම් ආචාරය පුද කරනවා. මේ සඟරාවේ අනික් ලිපිවලින් ඒ කලාකරුවන් හා ඔවුන්ගේ නිර්මාණයන් ගැන වැඩිදුර සාකච්ඡා වෙනවා.

## සංස්කෘතික අරගලය ඉදිරියට.....

**අවදිය තේරුම් ගත් හැම ප්‍රගතිශීලි සංස්කෘතික සේවකයෙක්ම පොදු සහෝදරත්වයක් තුළය බහුජනතාවට සේවය කළ යුත්තේ......ප්‍රගතිශීලීන් දෙන්නෙක් අතර ප්‍රතිවිරෝධතා පැවතිය යුත්තේ, ඒ මිතුදම හා සහෝදරත්වය තුළමයි. ඒවා අවශ්‍යයෙන්ම මිතුරු ප්‍රතිවිරෝධතා වෙන අතර, ඒවා දෙගොල්ලගේම සංවර්ධනය සඳහා ගලපා ගත යුතුයි.**

අද ප්‍රගතිශීලි සංස්කෘතික ව්‍යාපාරය ප්‍රමාණයෙන් සෑහෙන ජයක් ලබා තිබුණත් ගුණයෙන් එය විශිෂ්ඨ හෝ පරිණත නැහැ. ඊට කල් පවතින්නට පුළුවන් තිරසාර පදනමක් තවම වැටී නැහැ. 1970 න් පසු ජයග්‍රහණය විශිෂ්ඨ තත්වයකට පත්කිරීමේ අභියෝගයටය දැන් අපි මුහුණලා තියෙන්නේ.

1970 ට පසු අරගලයේ අත්දැකීම හරහායි මේ අභියෝගය ජය ගැනීමේ මහ වැටී ඇත්තේ. මේ අරගල කරන්නන් අපේ සමීපම මිතුරන් වශයෙන් සලකන අතර, එය හරවත් හා විධිමත් කිරිම සඳහා එම මිතුරන්ද විවේචනය කිරිමට අපට සිදු වෙනවා.

ප්‍රගතිශීලි හරයක් ඇති වැදගත් ප්‍රශ්න විෂය කර ගනිමින් ගොඩනගන්නට උත්සාහ ගත් 'ඉඩම', 'නරියා සහ කේතු', 'රන් දහඩිය', 'සූරිය උදා වෙන තුරු' වැනි නිර්මාණවල, පැහැදිලි ලෙසම මනෝරාජික අඩංගුවක් තිබෙනවා. මෙවැනි නිර්මාණ ප්‍රගතිශීලි මතවාදයට සේවය කිරිම උදෙසා වෙහෙස මහන්සියෙන් රචනා කළ ඒවා බව නිසැකයි. නවයටත් විජිතවාදි මතවාදය සාර්ථකව පිටු දැක විකල්ප අරගල මත වාදයක් ගොඩනැගීමට වැයම් කිරිම ගැන මේ කලාකරුවන්ට සුබ පතන අතර, ඒවායේ මනෝරාජික ගතිය අපටම අවාසිදයක බව පෙන්වා දිය යුතුයි. ඒවා ජනතා ප්‍රශ්න ග්‍රහණය කර ගැනීමට ගත් එඩිතර ඉදිරි පියවරයන් උනත්, අවසානයේදී ඒවාට විෂය වෙලා තියෙන්නේ සිතින් මවා ගත් තත්වයන් මිස සමාජ යථාර්ථය නොවෙයි.

'සුහ සහ යස' නාට්‍යයෙන් දියත් වුන තව නැම්මකි, ඉතිහාස කතාවලට අලුත් තේරුමක් දෙන්නට උත්සාහ ගැනීම. සම්මත ඉතිහාසයේ යථාර්තය ප්‍රගතිශීලි දෘෂ්ටියේ එළියෙන් මතු කිරිමයි ඉතිහාසය විග්‍රහ කරන හැබෑ කලාකරුවාගේ කාර්යය විය යුත්තේ. මෙය මේ කාලයේ අවශ්‍යයෙන්ම කළ යුතු කාරියක්. ඒත් මේ වගකීම භාර ගන්නා කලාකරුවා, ඊට අවශ්‍ය පරිචය වැර වෑයමෙන් පුරුදු පුහුණු කර ගත යුතුයි. ඉතිහාසයට නව අරුත් දීම යයි කියන්නේ, හුදු සම්ප්‍රදය විරෝධිබවටවත්, සම්මත වීර චරිත සමච්චලයට භාජනය කිරිමටවත්, අප්‍රකට චරිත වීරත්වයට පත් කිරිමටවත් නොවෙයි. ඉතිහාසයට නව අරුත් දීමට ප්‍රගතිශීලි ඉතිහාස දැක්මක් ඕනෑ. නව දැක්මකින් විතරයි නව හරයක් හසු කර ගන්න පුළුවන් වෙන්නේ. පරිණත දැක්මකින් විතරයි පරිණත නව හරයක් මතු කරගන්න පුළුවන් වෙන්නේ. පාලක පංතියේ පුද්ගලයින් අතලොස්සක් වටා ගොඩනැගී ඇති ව්‍යාජ ඉතිහාස පටලය විනිවිද දැකලා, ඉතිහාසය සැබැවටම නිර්මාණය කළ නිහඬ ජනතාවගේ හා ජන නායකයින්ගේ වැළලී තියෙන වීරත්වය රසවත්ව හෙළිදරව් කිරීමයි අපට අවශ්‍යවී ඇත්තේ. එවැනි හරවත් විමසුමකට අදාළ වකවානුවේ සමාජ සංවිධානය, දේශපාලනය, ආර්ථිකය හා සිතුම් පැතුම් යනාදිය එක්වර තමාගේ විවරණයට හසුවිය යුතුය. මෙහිදී අපට බර්ටෝල්ට් බ්‍රෙක්ට්ගෙන් හා ලූහ් සුන්ගෙන් අපූරු පාඩම් පෙළක් ඉගෙන ගන්න පුළුවන්. ඒත් 'සුහ සහ යස' වැනි නාට්‍යවලින් අපට අවශ්‍ය ආභාසය ලබා ගන්න බැරි බව පැහැදිලියි.

ප්‍රගතිශීලි නව නිර්මාණ බොහෝමයකට එල්ල වෙන විවේචනයක් තමයි, ඒවා ප්‍රචාරාත්මකයි කීම, නැත්නම් ඒවායේ ඇත්තේ සටන් පාඨ යයි කීම. මෙය ප්‍රතිගාමීන්ගේ අවියක් නිසා ඒ පිළිබඳ නිවැරදි මතයක් අවශ්‍යයි. කොයිතරම් මනෝමය හා වියුක්ත ස්වරූපයක් කලා කෘතියක් විසින් ගනු ලැබූවත්, ඉන් දැනුම නිර්මාණය වෙන බව අපි කිවව්වා. ඒ නිසා **හැම කෘතියක් තුළම මොකක් හරි මතයක් 'ප්‍රචාරය' වෙනවා.** ඒත් එක් එක් වර්ගයේ කෘතිවල මත ප්‍රචාරය වෙන විදිහ වෙනස්. ලිංගික ආසාව ජීවිතයේ වැදගත්ම සාධකයයි කියා පාන නවකථාවකට සම්මත විචාරකයින් ප්‍රචාරාත්මකයි කියල කියන්නේ නැහැ. ඒත් දේශපාලනය පසුබිම් කරගත් නව කථාවකට නම් එහෙම කීමට හොඳමට ඉඩ තියෙනවා. මෙයින් අපි තේරුම් ගන්න ඕනෑ, අධිපති මතවාදය විසින් යම් යම් මාතෘකා හා ආකල්පවලට පමණක් ප්‍රචාරාත්මකයි යන හංවඩුව ගැසීමේ සාවද්‍ය ව්‍යාපාරයක් තියෙන බව. ප්‍රගතිශීලි විචාරයේදී නම් මේ ප්‍රචාරාත්මක භාවය මුල් කර ගත් විචාර කෝඳුව පාවිච්චි කෙරෙන්නේම නැහැ. එහි විචාර පදනම වෙන්නේ සමාජ යථාර්තය නිරූපනය වීමේ ප්‍රමාණය, ගුණය හා ආකාරයයි. ඒ නිසා සමාජ යථාර්තය අව්‍යාජව නිරූපණය කිරීම ප්‍රචාරාත්මක යයි සම්මත විචාරයට පෙනීම, ප්‍රගතිශීලි රසිකයන්ට නම් ප්‍රශ්නයක් වෙන්නේ නැත.

කලා කෘතියක් නිර්මාණය කර ඇත්තේ කුමක් සඳහාද, කා සඳහාද කියන සාධක දෙකත්, එහි ප්‍රචාරාත්මකභාවයට බලපානවා. වෙසක් හෝ පාස්කු නාට්‍යයකයි, විදි නාට්‍යයකයි, කවි මඩුවකයි, කවි කොලයකයි, ප්‍රගතිශීලි නවකථාවකයි, මංසන්දියක ඉදි කරන ප්‍රතිමාවකයි අපට එක සමාන ප්‍රචාරාත්මකබවක් බලාපොරොත්තු වෙන්න බැහැ. තැන, පිරිස හා අවශ්‍යතාවය අනුව, එය වෙනස් වෙනවා. අනික එය යම් නිශ්චිත රසික පිරිසක් සඳහා නිර්මාණය කර ඇත්නම්, මූලික වශයෙන් එහි ප්‍රචාරාත්මකභාවය හොඳද නරකදැයි තීරණය කළ යුත්තේ ඒ පිරිස විසිනුයි.

1970 ට පසුව පැහැදිලිව පෙනෙන තවත් නවාංගයක් තමයි කලාව හා අදහස් බහුජනතාව වෙත ගෙන යාමට නව විලාස යන් නැත්නම් ආකෘතීන් සෙවීම. කවි පත්‍රිකා නැත්නම් නව පන්නයේ කවිකොල, විචාර පත්‍රිකා, විදි නාට්‍ය, කවි හඬ නඟා කියවීමේ රැස්වීම්, කෙටි චිත්‍රපටි, නව පන්නයේ විචිත්‍ර පෝස්ටර්, කෙටිම කෙටි උපමා කථා මේ නව සෙවිල්ලේ දයාදයන්ය. මේ උත්සාහයන්ගෙන් අවංකව බහුජනතාවට සේවය කිරීමේ අදහසින්ම කර තිබෙන අත්හදබැලීම්, පැසසිය යුතුයි. ඒවායේ අඩුවියදම් පිරිමැසුම්දායක ගුණය, අදට අවශ්‍යයි. ඒත් ඒවාට ගැබ්වෙන හරය තීරණාත්මක බව අමතක කළ යුතු නැහැ. නව විලාසයක් පමණක් අපේ අරගලයට ප්‍රමාණවත් නැහැ. නව හරයක් ඊට වඩා වැදගත් වන අතර එයද අවශ්‍යමයි. මෙහිදී මතවාදි අභේනිය කෙලින්ම බලපානවා. සාරවත් හරයක් ගොඩනැගෙන්නේ ප්‍රගතිශීලි මතවාදයක් ඇසුරෙන් විතරයි.

## අරගලය ඉදිරියට ගෙන යමු

අරගලය ඉදිරියට ගෙන යාමේ මහ වැටී ඇත්තේ මතවාදී අභේනිය ජයගැනීමෙන් හා නව ජනතාවාදී සංස්කෘතික ව්‍යාපාරයේ හරය හා පදනම තව තවත් සවිමත් කිරීමෙනුයි.

අරගලය ඉදිරියට ගෙන යාම තේරුම් ගැනීමේදී නව වැදගත් ස්ථාවර කීපයකට එළඹෙන්නට අපට සිදු වෙනවා. ඒවා ඔබ සමග හුවමාරු කර ගෙන, ඒ ගැන ඔබේ අදහස් උදහස් දැනගැනීම අපට ප්‍රයෝජනවත්.

1. **සමගිය. අවදිය තේරුම් ගත් හැම ප්‍රගතිශීලි සංස්කෘතික සේවකයෙක්ම පොදු සහෝදරත්වයක් තුළය බහු ජනතාවට සේවය කළ යුත්තේ.** එක් ප්‍රගතිශීලියෙක් කවදුවත් තව ප්‍රගතිශීලියෙකුගේ හතුරෙක් වෙන්න බැහැ. ඔවුන් නිසැකවම මිතුරන් විය යුතුය. එයයි අපේ ස්ථාවරය. හතුරා සමග සටනේදී සමගිය අත්‍යාවශ්‍යයි. මිතුරන් අතර අසමගියෙන් හතුරාට වාසි සැලසෙනවා. එකම අරමුණින් යුතුව අරගලයක යෙදෙන්නන් වශයෙන් සමගියෙන් කටයුතු කිරීම අත්‍යාවශ්‍යයි. **ප්‍රගතිශීලීන් දෙන්නෙක් අතර ප්‍රතිවිරෝධතා පැවතිය යුත්තේ, ඒ මිතුදම හා සහෝදරත්වය තුළමයි. ඒවා අවශ්‍යයෙන්ම මිතුරු ප්‍රතිවිරෝධතා වෙන අතර, ඒවා දෙගොල්ලගේම සංවර්ධනය සඳහා ගලපා ගත යුතුයි.** සමගිය ගොඩ නැගීම ජාතික මෙහෙයක් බවයි අප සලකන්නේ. එහි කට්ටිවාදයට, කුලවාදයට, ජාතිභේදවාදයට හා පුද්ගලවාදයට ඉඩක් නැහැ. ප්‍රගතිශීලි බහුජනතාවට සේවය කර තිබෙන හා සේවය කරන හැම කෙනෙක් දිහාම මාවත බලන්නේ මේ විදිහටයි. සමගිය ගොඩනගන හැම ආයතනයකට හා පුද්ගලයෙකුටම අපි ගරු කරනවා. මේ පිළිබඳ අසහාය සේවයක් කරපු කුමාරතුංග මුනිදස, හේමපාල මුනිදස හා අලිවිස් පෙරේරාට අපේ විශේෂ ආචාරය පුද කරනවා.

2. **විචාරය.** ප්‍රගතිශීලීන්ගේ අසමගියට විචාරය විශේෂයෙන්ම හේතු වී තියෙනවා. බොහෝ විට විචාරය පාවිච්චි කර තිබෙන්නේ ගොඩනැගීමට නොවෙයි, බිඳ හෙලීමට හා පුද්ගලයින් හුවා දැක්වීමටය. **පුද්ගලවාදය පිටු දකිමින්, වැරදි දේ බිඳ දැමීම තුළින් නිවැරදි දේ ගොඩනැගීම සඳහාම විචාරය යොද ගත යුතුයි යන්න මාවතේ ස්ථාවරයයි.** ගොඩ නැගීම යනුවෙන් අදහස් කරන්නේ සියලු සංස්කෘතික සේවකයින් සමාජයට අවශ්‍යව ඇති නිවැරදි මහට යොමු කිරීම, ප්‍රගතිශීලි නිර්මාණ කරණය හා විවේචනය සංවර්ධනය කිරීම, ප්‍රගතිශීලි සංස්කෘතික සේවකයින්ගේ සමගිය හා සහෝදරත්වය වර්ධනය කිරීම වැනි ක්‍රියාදමයන්ගේ වැඩීමය. විවේචනය හේතු සහිත බිඳ හෙලීමේ ක්‍රියාවක් වෙන්නේ, හතුරාගේ වැඩ කටයුතු විවේචනය කිරීමේදී පමණයි. විචාරය සමගිය සඳහා යොද ගන්නේ කොහොමද? හැම ප්‍රගතිශීලි කෘතියකම හොඳ පැත්ත වගේම දුර්වල පැත්තත් සාකච්ඡා කිරීමෙන්; නවයටත්විජිතවාදී හතුරු සංස්කෘතියට එරෙහිව ගොඩනගන ජාතික සංස්කෘතිය සඳහා කෘතියකින් වෙන සේවයට වටිනාකමක් දීමෙන්; ප්‍රසිද්ධ විවේචනවලින් මෙන්ම පෞද්ගලිකව කෙරෙන විවේචනවලින්.

3. **ජාතීන් අතර සමගිය.** ප්‍රගතිශීලි සංස්කෘතික ව්‍යාපාරය කෙලින්ම සිංහල, දෙමළ, මුස්ලිම් හා වෙනත් ජනකොටස් අතර සමගිය වර්ධනය කරන්නක් විය යුතුය. මීට මුල් තැනක් දීම වැදගත්. **අද සංස්කෘතික අරගලය ජාතික අරගලයක්. ඒ නිසා එය එක ජාතියකට හෝ කොටසකට විතරක් සීමා වෙන්නේ නැහැ. එය සෑම ජන කොට සකටම පොදුවේ උරුම වන්නක්.** මෙහිදී අරුමුග නාවලර්, පොන්නම්බලම් අරුනාචලම්, පොන්නම්බලම් රාමනාදන්, ආනන්ද කුමාරස්වාමි, කේ. නටේස අයියර්, ස්වාමි විපුලානන්ද, එම්. සී. සිද්දි ලෙබ්බෙ, ඒ. එම්. ඒ. අසීස්, ඒ. ඊ. බූල්ජන්ස්, පී. එම්. ලිස්බොආ පින්තු වැනි අධිරාජ්‍යවිරෝධී හා යටත්විජිත විරෝධී අරගලයේදී සිංහලයින් සමග ජාතික නායකත්වයක් සැපයූ දෙමළ, මුස්ලිම්, හා ලන්සි බුද්ධිමතුන් ගේ සේවය අපට නැවත නැවතත් මතක් වෙනවා. සිංහලෙන් කරන සංස්කෘතික අරගලයට හරයෙන් හා ස්වරූපයෙන් සමාන සංස්කෘතික අරගලයක් දෙමළ කථා කරන කොටස්ද කරන බව ඒ ගැන සොයන් නෙකුට පැහැදිලිව පේනවා.

4. **ගම්බද සංස්කෘතික පිබිදීම.** අද ගම්බදව නව සංස්කෘතික පිබිදීමක් සිදුවෙමින් පවතිනවා. පාසැල්වල, ජනාවාසවල, තරුණ ගොවිපල්වල, කලායතනවල, පෞද්ගලික කණ්ඩායම් අතර, කලා සංගම්වල, පැරණි ශිල්පීන් අතර හා ගම්වල නන්වැදෑරුම් ස්වරූපවලින් මේ ප්‍රබෝධය ප්‍රකාශ වෙනවා. අගනුවරින් පිට නාට්‍ය බැලීමට තිබෙන උනන්දුව විශේෂයෙන් කැපී පෙනෙන සාධකයක්. විශාල **අපහසුකම් මැද ගැමි ජනතාව විසින්, ගැමි ජනතාව සඳහාම, ස්වශක්තිය මත පිහිටා හද වඩා ගෙන එන මේ සංස්කෘතික ව්‍යාපාරයට අපේ විශේෂ සැලකිල්ල යොමු විය යුතුයි.**

මේ පිබිදීම මාවතේ පවා අවශ්‍ය ප්‍රමාණයට නියෝජනය නොවන බව අපි පිළිගන්නවා. ගමේ සංස්කෘතික ප්‍රශ්න සාකච්ඡා කිරීම මගින් එය තේරුම් ගැනීම හා ශක්තිමත් කිරීමද අපේ වගකීමක්. ●

සංස්කාරකවරු


**අසෝක පොත්හල**

183, ගාලු පාර
(බම්බලපිටිය කෝවිල ළඟ)
කොළඹ 4.

— බුද්ධිමතාට, පර්යේෂකයාට හා ප්‍රගතිශීලියාට පොත්
— සාමාන්‍යයෙන් වෙළඳපොලේ සොයා ගන්නට බැරි විශිෂ්ට සම්භාවනීය හා නූතන පොත්
— ලංකාව පිළිබඳ දුර්ලභ පොත්
— සමාජ විද්‍යාව පිළිබඳ විශේෂ ඉංග්‍රීසි පොත්
— නූතන ඉංග්‍රීසි ප්‍රබන්ධ සාහිත්‍ය පිළිබඳ විශිෂ්ට හා විශාල පොත් සම්භාරයක්
— අපූරු ශාස්ත්‍රීය හා ජනප්‍රිය සඟරා